ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
ඉඩම් මහලේකම් කාර්යාලය,
නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல: 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2864051
ඊමේල් / ஈ-மெயில் / E-mail - info@landcommdept.gov.lk

මගේ අංකය / எனது இல / MY NO - 4/පී/ම.ප/බස්නාහිර පළාත/කොළඹ
ඔබේ අංකය / உமது இல / YOUR NO -
දිනය / திகதි / DATE - 2013. 08. 01.

රෙජිස්ට්‍රාර් ජනරාල්,
234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
07 AUG 2013
තැපැල් අංශය
බත්තරමුල්ල

5190

**ජනාධිපති ලේකම්ගේ 1986.04.16 දින අංක.ඕ/ක/37 දරණ රජයේ දීමනා පත්‍රය ලියාපදිංචි කිරීමේදී සිදුවී ඇති වරද නිවැරදි කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක ආර්ජී/එන්බී/11/2/35/914/20136 හා 2013.07.10 දිනැති ලිපිය හා බැඳේ.

02. උක්ත ලිපිය සමඟ ඔබ විසින් අමුණා එවනු ලැබූ ඕ/ක/37 දරණ ප්‍රදාන පත්‍රය අධ්‍යයනය කරන විට පෙනී යන්නේ එය ඉඩම් සංවර්ධන ආඥා පනතේ 159 වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විශේෂිත දීමනා පත්‍රයක් බවයි. ඉඩම් සංවර්ධන ආඥා පනතේ 159 (ආ) උප වගන්තිය හඳුන්වා දී තිබෙන්නේ ඉඩම් නිදහස් කිරීමේ ආඥා පනත යටතේ රජය විසින් නිදහස් කර දෙනු ලබන ඉඩම් සඳහා නිදහස් දීමනා පත්‍ර ලබා දීම පරමාර්ථ කොට ගෙනයි.මේ ඉඩම් සඳහා රජය විසින් වැය කරන ලද මුදල් හිමිකරු වෙතින් ලබා ගැනීමෙන් අනතුරුව ඔහු වෙත මෙසේ 159 වන වගන්තිය යටතේ ලබා දෙන දීමනා පත්‍රය කොන්දේසි විරහිත නිදහස් දීමනා පත්‍රයක් ලෙස නිකුත් කරනු ලබයි.

03. කරුණු මෙසේ හෙයින් ඉහත නීතිමය ප්‍රතිපාදන යටතේ ලබා දෙන්නාවූ දීමනා පත්‍රයක් අයිතිකරුට පූර්ණ හිමිකමක් ලබා දෙන අතර එය වෙනත් කොන්දේසි වලට හෝ බැඳීම් වලට යටත් කොට නොමැති හෙයින් ඉඩම හිමිකරුගේ පෞද්ගලික දේපලක් හා සමාන වේ. ඒ අනුව එම දීමනා පත්‍ර ලියාපදිංචි කිරීමේදී හා අදාළ පසු කටයුතු වලදී ඉහත නීතිමය ප්‍රතිපාදන නිසා පෞද්ගලික ඉඩම් ලියාපදිංචි කරනු ලබන ක්‍රියාදාමය යටතේ ලියාපදිංචි කල යුතු බව කාරුණිකව පෙන්වා දෙමි.

බී.ආර්. සේනාරත්න
සහකාර-ඉඩම් කොමසාරිස් (නීති)
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට